ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>UPI සේවා ශ්‍රී ලංකාවේ දියත් කෙරේ</u>

ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මහතා ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ මොරිෂස් රාජ්‍යයේ අග්‍රාමාත්‍ය ප්‍රවින්ද් ජුග්නෝත් මහතා සමඟ එක්ව අද දින වීඩියෝ තාක්ෂණය ඔස්සේ ශ්‍රී ලංකාවේ සහ මොරිෂස් හි ඒකාබද්ධ ගෙවීම් සේවා දියත් කළේය.

2. ජනාධිපති වික්‍රමසිංහ මහතා අයෝධ්‍යා ධාම් හි ශ්‍රී රාම් මන්දීර් කෝවිල විවෘත කිරීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාට සිය සුභාශිංසන පළ කළේය. දෙරට අතර පවතින සියවස් ගණනාවක් පැරණි ආර්ථික සබඳතා ද ජනාධිපතිතුමා විසින් සිහිපත් කරන ලදී. සම්බන්ධකතාවය ඉහළ නැංවීමේ ජවය පවත්වාගෙන යාමට සහ දෙරට අතර සම්බන්ධතාවය වඩා ශක්තිමත් කිරීමට අපේක්ෂා කරන බව එතුමා සඳහන් කළේය.

3. මෙම අවස්ථාව අමතමින් අග්‍රාමාත්‍යතුමා සඳහන් කළේ ඉන්දියාව, ශ්‍රී ලංකාව සහ මොරිෂස් යන මිත්‍රශීලී රාජ්‍යයන් ත්‍රිත්වයෙහි ඓතිහාසික සබඳතා නවීන ඩිජිටල් සම්බන්ධතාවයක් දක්වා වර්ධනය වන අද දින ඉතා සුවිශේෂී දිනයක් වන බවයි. ජනතාවගේ සංවර්ධනය උදෙසා

රජයේ කැපවීමට එය සාක්ෂියක් වන බව එතුමා ප්‍රකාශ කළේය. මූල්‍ය තාක්ෂණ සම්බන්ධකතාවය දේශසීමා හරහා සිදුකරන ගනුදෙනු සහ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරනු ඇතැයි එතුමා අවධාරණය කළේය. ඉන්දියාවේ ඒකාබද්ධ ගෙවීම් අතුරු මුහුණත (UPI) ඉන්දියාව සමඟ සහකරුවන් එක් කරමින් අද දින නව භූමිකාවක් ඉටු කරන බව අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කළේය.

4. ඩිජිටල් යටිතල පහසුකම් ඉන්දියාව තුළ විප්ලවීය වෙනසක් සිදු කර ඇති බව සඳහන් කළ අග්‍රාමාත්‍යතුමා ඈත දුෂ්කර ගම්මානවල කුඩාම ප්‍රමාණයේ වෙළෙන්දන් පවා UPI භාවිතා කරමින් ඩිජිටල් ගෙවීම් සිදු කරන බව පෙන්වා දුන්නේය. UPI ගනුදෙනුවල පහසුව සහ වේගය පිළිබඳ සඳහන් කරමින් අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කළේ පසුගිය වසර තුළ UPI හරහා ගනුදෙනු බිලියන 100කට අධික ප්‍රමාණයක් සිදු කර ඇති බවයි. ඒවායේ වටිනාකම ඉන්දියානු රුපියල් කෝටි ලක්ෂ 2ක් හෙවත් ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන 8ක් නැතහොත් මොරිෂස් රුපියල් ට්‍රිලියන 1ක් වන බව එතුමා සඳහන් කළේය. ජන්-දන්, ආධාර් සහ ජංගම දුරකථන යන ත්‍රිත්වය (JAM) යොදා ගනිමින් ඇමරිකානු ඩොලර් බිලියන 400ක් ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම්වලට යොමු කර ඇති බව අග්‍රාමාත්‍යතුමා  ප්‍රකාශ කළේය. CoWin වේදිකාව හරහා ඉන්දියාව ලොව විශාලතම එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක කළ බව ද එතුමා සඳහන් කළේය. තාක්ෂණය

භාවිතා කිරීම විනිවිදභාවය ප්‍රවර්ධනය කරන බව, දූෂණය අවම කරන බව සහ සමාජයේ අන්තර්ග්‍රහණීයත්වය ඉහළ නංවන බව  එතුමා පැවසීය.

5. ඉන්දියාවේ ප්‍රතිපත්තිය “අසල්වැසියා ප්‍රථමයෙන්” යන්න බව අග්‍රාමාත්‍යතුමා අවධාරණය කළේය. අපගේ සමුද්‍රීය දැක්ම වන්නේ කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය හෙවත් සාගර් (SAGAR) යන්නයි. ඉන්දියාව සිය සංවර්ධනය සිය අසල්වැසියන්ගෙන් වෙන්ව නොදකියි.

6. ශ්‍රී ලංකා ජනාධිපතිතුමාගේ පසුගිය ඉන්දීය සංචාරය අතරතුරදී සම්මත කරගත් දැක්ම ප්‍රකාශනය පිළිබඳ සිහිපත් කරමින් අග්‍රාමාත්‍යතුමා සඳහන් කළේ මූල්‍ය සම්බන්ධකතාවය ශක්තිමත් කිරීම එහි ප්‍රධාන අංගයක් වන බවයි. UPI සමබන්ධතාවය ශ්‍රී ලංකාවට සහ මොරිෂස් රාජ්‍යයට ප්‍රතිලාභදායි වනු ඇති බව සඳහන් කළ එතුමා එමගින් ඩිජිටල් පරිවර්තනය වේගවත් වනු ඇතැයි ද දේශීය ආර්ථිකයන් සුබදායි වෙනසක් අත්දකිනු ඇතැයි ද සංචාරක කර්මාන්තය වර්ධනය වනු ඇතැයි ද ප්‍රකාශ කළේය. ඉන්දීය සංචාරකයන් UPI සහිත ගමනාන්තයන්ට ප්‍රමුඛත්වය දෙනු ඇතැයි එතුමා විශ්වාසය පළ කළේය. ශ්‍රී ලංකාවේ සහ මොරිෂස් හි ජීවත් වන ඉන්දියානු සම්භවයක් ඇති ජනතාවට ද ඒ හරහා විශේෂ ප්‍රතිලාභ හිමි වනු ඇතැයි අග්‍රාමාත්‍යතුමා සඳහන් කළේය.

7. අද දින UPI වැඩසටහන සමාරම්භ කිරීම ගෝලීය දකුණේ සාර්ථකත්වය සංකේතවත් කරන බව අග්‍රාමාත්‍යතුමා

පැවසීය. “අපගේ සබඳතා හුදු ගනුදෙනු පමණක්ම නොවේ. එය ඓතිහාසික බැඳීමක්” යනුවෙන් එතුමා ප්‍රකාශ කළ අතර රටවල් ත්‍රිත්වයෙහි ජනතාව අතර සබඳතාහි ශක්තිමත්භාවය අවධාරණය කළේය. පසුගිය වසර දහය තුළ ඉන්දියාව අසල්වැසි මිතුරන්ට සහයෝගය දැක්වූ බව සිහිපත් කළ අග්‍රාමාත්‍යතුමා ඉන්දියාව ස්වාභාවික විපත්, සෞඛ්‍ය ගැටළු, ආර්ථික අර්බුද, ජාත්‍යන්තර වේදිකාවේ සහයෝගය වැනි කවර හෝ අවස්ථාවන් හිදී සිය මිතුරන්ට අවැසි මොහොතේ දී රැඳී සිට ඇති බව ප්‍රකාශ කළේය. ඉන්දියාව පළමු ප්‍රතිචාරකයා වී ඇති බව ද ඉදිරියටත් එසේම කටයුතු කරනු ඇති බව ද එතුමා අවධාරණය කළේය. ඉන්දියාවේ G20 සභාපතිත්වය අතරතුර ගෝලීය දකුණට අදළ ගැටළු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ලබා දුන් බව ද අග්‍රාමාත්‍යතුමා පෙන්වා දුන්නේය. ඉන්දියාවේ ඩිජිටල් පොදු යටිතල පහසුකම්හි ප්‍රතිලාභ ගෝලීය දකුණේ රටවලට ලබා දීම සඳහා සමාජ බලපෑම් පදනමක් පිහිටුවීම සම්බන්ධයෙන් ද එතුමා මෙහිදී සඳහන් කළේය.

8. සිය කතාව නිමා කරමින් අග්‍රාමාත්‍යතුමා අද දින UPI සේවා දියත් කිරීමෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කළ ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට සහ අග්‍රාමාත්‍ය ප්‍රවින්ද් ජුග්නෝත් මහතාට සිය හෘදයාංගම කෘතවේදිත්වය පළ කළේය. මෙම වැඩසටහන සාර්ථක කරගැනීමට සහයෝගය ලබාදුන් රටවල් ත්‍රිත්වයෙහි මහ බැංකු සහ නියෝජිතායතන වලට ද එතුමා සිය ස්තුතිය පළ කළේය.

9. ඉන්දීය සංචිත බැංකුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මඟ පෙන්වීම යටතේ ඉන්දියාවේ NPCI ඉන්ටර්නැෂනල් පේමන්ට්ස් ලිමිටඩ් සහ ශ්‍රී ලංකාවේ ලංකා පේ සමාගම LankaQR හරහා UPI සේවා පිළිගැනීම සඳහා එක්වී ඇත. මේ හරහා ශ්‍රී ලංකාවේ වෙළෙන්දන්ට ඉන්දීය සංචාරකයන්ගෙන් සුමට ඩිජිටල් ගෙවීම් භාරගැනීමට අවස්ථාව හිමි වනු ඇත. මෙවැනි අන්තර් සම්බන්ධතා ඉන්දීය සංචාරකයන්ට පහසුවක් ගෙන දෙනු ඇති අතර ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ද වාසිදයක වනු ඇත. එසේම, එය මූල්‍ය තාක්ෂණ සහ ඩිජිටල් ක්ෂේත්‍රය තුළ ඉහළ සම්බන්ධකතාවයක් ප්‍රවර්ධනය කිරීමට ද ඉවහල් වනු ඇත. ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කළ මෙම සමාරම්භක අවස්ථාවට කොළඹ පිහිටි බැංකු, ව්‍යාපාර සහ ඉන්දීය ප්‍රජාව ඇතුළු බොහෝ දෙනා සහභාගී වූ අතර වැඩසටහන සජීවීව විකාශය කිරීමට ද කටයුතු යොදා තිබිණ.

***

*කොළඹ*

*2024 පෙබරවාරි 12*